සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** **60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

<u>උපදෙස් :</u>

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල ( × ) ලකුණ යොදන්න.

---

- පහත සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නියඟයෙන් පීඩා විඳි ජනයාට ඊසාන දිග මෝසම් සුළං සක්‍රීය වීමෙන්, පසු ගිය දින ඇද හැලුණු මහා වර්ෂාවෙන් වී වගා බිම් හා නිවාස විශාල ප්‍රමාණයක් ගංවතුරෙන් විනාශ විය. ගංවතුරෙන් යට වූ ප්‍රදේශවල ජනයා ගුවන් හමුදාව විසින් හෙලිකොප්ටර් යානා යොදවා බේරා ගන්නා ලදී. සමාජ සේවා දෙපාර්තමේන්තුව අවතැන් වූ ජනයාට ආහාර ද්‍රව්‍ය බෙදා දෙන ලදී.

01. මෙම සිද්ධියේ සඳහන් අවශ්‍යතා වන්නේ,
    (1) ආහාර, සන්නිවේදනය, ආරක්ෂාව, ඇඳුම් (2) ආහාර, ප්‍රවාහනය, විනෝදය, නිවාස
    (3) ආහාර, ප්‍රවාහනය, ආරක්ෂාව, නිවාස (4) ආහාර, අධ්‍යාපනය, ප්‍රවාහනය, ඇඳුම්

02. නියඟය හා ගංවතුර නිසා වගා බිම් විනාශ වීම ව්‍යාපාරවලට,
    (1) තර්ජනයකි. (2) අවස්ථාවකි. (3) ශක්තියකි. (4) දුර්වලතාවයකි.

03. මෙම සිද්ධියේ සඳහන් වගාබිම් අයත් නිෂ්පාදන සාධකය වන්නේ,
    (1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසාය

04. මෙම සිද්ධියේ සඳහන් ප්‍රවාහන මාධ්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
    (1) විශාල භාණ්ඩ ප්‍රමාණයක් එකවර ප්‍රවාහනයට සුදුසු වේ.
    (2) ප්‍රවාහන වියදම අධික නැත.
    (3) ඉක්මනින් නශ්‍ය වන භාණ්ඩ ප්‍රවාහනය සඳහා සුදුසු නොවේ.
    (4) පිවිසීමේ හැකියාව අතින් ඉතා ඉහළ වේ.

05. මෙම සිද්ධියේ සඳහන් සමාජ සේවා දෙපාර්තමේන්තුව,
    (1) රාජ්‍ය අංශයේ ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි.
    (2) වාර්ෂික අයවැය ලේඛනය මගින් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කෙරේ.
    (3) රාජ්‍ය මූල්‍ය රෙගුලාසි චක්‍රලේඛන අනුව කටයුතු කළ යුතු නොවේ.
    (4) පාලනය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු කරයි.

06. පහත සඳහන් ව්‍යාපාර ආයතන අතුරෙන් නීතිමය පුද්ගලභාවයක් නොමැති ආයතනය තෝරන්න.
    (1) සිලෝන් බිස්කට් සමාගම (2) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
    (3) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (4) ඩයලොග් ආසියාටා සමාගම

07. ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර ව්‍යාපාර නාමය ලියාපදිංචිය සඳහා යොමු කළ යුතු වන්නේ,
    (1) දින 7 ඇතුළත ය. (2) දින 14 ඇතුළත ය. (3) දින 15 ඇතුළත ය. (4) දින 21 ඇතුළත ය.

08. ඉතිරිකිරීමේ ගිණුමක් පවත්වාගෙන යාමෙන් ගිණුම් හිමියාට ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,

(1) පොලී ආදායමක් ලැබීම. (2) පහසුවෙන් මුදල් ලබාගත හැකි වීම.

(3) ණයපත් ලබාගත හැකිවීම. (4) මුදලට ආරක්ෂිත බවත් ලැබීම.


09. මිහිඳු ආරියරත්න මහතා විසින් තම මෝටර් රථය හේමාල් බංඩාර මහතා වෙත විකුණන ලද අතර හේමාල් බංඩාර මහතා විසින් එම මෝටර් රථය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණය කරන ලදී. මෙම රක්ෂණාවරණයට අදාළ පාර්ශවයක් නොවන්නේ,


(1) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (2) හේමාල් බංඩාර

(3) මෝටර් රථය (4) මිහිඳු ආරියරත්න

10. චෙක්පතකට උපරිම ආරක්ෂාව ලබා දී ඇති රේඛනය තෝරන්න.

(1) 


(2) 

(3) 


(4) 


11. සමන්ති සිල්වා මහත්මිය රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යයි. තම ව්‍යාපාරික කටයුතු හේතුවෙන් තම ජීවිත රක්ෂණ වාරිකය නිසි පරිදි ගෙවා ගැනීමට ඇයට අපහසු වී ඇත. පහත ක්‍රම තුලින් සමන්ති සිල්වා මහත්මියට රක්ෂණ වාරිකය ගෙවා ගත හැකි යෝග්‍යම ක්‍රමය තෝරන්න.

(1) හරපතකින් ගෙවා දැමීම (2) චෙක්පතකින් ගෙවා දැමීම.

(3) ස්ථාවර නියෝග යටතේ ගෙවා දැමීම. (4) මුදල් තම නියෝජිතයාට ලබාදීම.

12. වාර පරීක්ෂණ ලකුණු මත දක්ෂ සිසුන් සඳහා ත්‍යාග ලබාදීමට අදහස් කරන විදුහල්පතිතුමා ත්‍යාග මිලදී ගැනීම සඳහා ගුරුවරුන්ගේ සහාය අපේක්ෂා කරයි. මේ සඳහා ගුරුවරු දැනුවත් කළ හැකි වඩාත් යෝග්‍ය සන්නිවේදන මාධ්‍ය පහත ඒවා අතුරෙන් කුමක්ද?

(1) දැන්වීම් පුවරුව (2) දුරකථනය (3) ලිපිය (4) ශබ්ද විකාශන යන්ත්‍රය

13. කොළඹ සිට අරුවක්කාරු දක්වා කසල ප්‍රවාහනය සඳහා සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරාගැනීමේදී මූලිකව සලකා බැලිය යුතු සාධකය කුමක්ද?

(1) පිරිවැය (2) සුලභතාව (3) ධාරිතාව (4) වේගය

14. කළමනාකරණයේදී පාලනය හා සම්බන්ධ නොවන ප්‍රකාශය මින් තෝරන්න.

(1) ව්‍යාපාරයේ කටයුතු සඳහා සේවකයන් පෙළඹවීම.

(2) ගුණාත්මයෙන් යුතු නිෂ්පාදිත බිහි වී ඇත්දැයි සොයා බැලීම.

(3) සැලසුම්කල පරිදි නිෂ්පාදන අලෙවි වී ඇත්දැයි සොයා බැලීම.

(4) අඩුපාඩු මගහරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

15. අලෙවිකරණයට අයත්වන කාර්යයක් නොවන්නේ,

(1) විකුණුම් සේවකයන් පුහුණු කිරීම.

(2) භාණ්ඩය නිෂ්පාදනය හා අලෙවිය සඳහා සැලසුමක් සකස් කිරීම.

(3) භාණ්ඩයහි ගුණාත්මය පරීක්ෂා කිරීම.

(4) භාණ්ඩය පිළිබඳ පාරිභෝගික ප්‍රතිචාර සොයා බැලීම.

16. රමල් සිරිවර්ධන ඔහු ඉතිරි කරගත් රු. 500 000 ආයෝජන කිරීමට සූදානමින් සිටී. ඔහු අපේක්ෂා කරන ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ පහත පරිදි වේ.

1 ස්ථිවර ප්‍රතිශතයක් යටතේ පොලී ආදායමක් ලැබීම.

2 ඕනෑම අවස්ථාවකදී මුදල් බවට පත් කළ හැකි වීම.

3 ආයෝජන කළ මුදල් ලැබීම සම්බන්ධයෙන් පූර්ණ රාජ්‍ය ආරක්ෂාව ලැබීම.

ඉහත දක්වන ලද ආයෝජන අවස්ථාව වන්නේ,

(1) කොටස්වල ආයෝජනය කිරීම. (2) දේපල මිලදී ගැනීම.

(3) භාණ්ඩාගාර බිල්පත් වල යෙදවීම. (4) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම.

17. කිසියම් දිනකට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ වටිනාකම් පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
| රු. 100 000 | = | රු. 75 000 | + | රු. 25 000 |

අයිතිකරු රු. 5 000 ක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීමෙන් පසු ඉහත ගිණුම්කරණ සමීකරණයෙහි අගයන් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
| (1) | රු. 105 000 | = | රු. 75 000 | + | රු. 30 000 |
| (2) | රු. 95 000 | = | රු. 70 000 | + | රු. 25 000 |
| (3) | රු. 100 000 | = | රු. 75 000 | + | රු. 25 000 |
| (4) | රු. 95 000 | = | රු. 75 000 | + | රු. 20 000 |

18. පහත ගනුදෙනු අතුරෙන් හිමිකමට බලපෑමක් ඇති නොකරන ගනුදෙනුව තෝරන්න.

(1) වරිපනම් ගාස්තු රු. 400 ක් මුදලින් ගෙවීම.

(2) අමතර ආදායම් රු. 500 ක් මුදලින් ලැබීම.

(3) අයිතිකරු තම පෞද්ගලික මුදලින් ණයහිමියන්ට රු. 5 000 ක් ගෙවීම.

(4) රු. 2 000 ක උපචිත විදුලි ගාස්තු මුදලින් ගෙවීම.

19. ණයගැතියකුගෙන් ව්‍යාපාරයට ලැබුණු රු.5 000 ක චෙක්පත එම අවස්ථාවේදී ම බැංකුවේ තැන්පත් කිරීම ව්‍යාපාරයේ ගිණුම් පොත්වල සටහන් කිරීමේදී භාවිත කරන මූලාශ්‍ර ලේඛනය ....①.... වන අතර මූලික සටහන් පොත ....②.... වේ. ඉහත ....①.... හා ....②.... යන ස්ථාන සඳහා නිවැරදි පිළිතුරු පිළිවෙලින් දැක්වෙන පිළිතුරු තෝරන්න.

(1) ලදුපත්, මුදල් පොත (2) ලදුපත, බැංකු ගිණුම

(3) චෙක් තැන්පතු පත, මුදල් පොත (4) චෙක් තැන්පතු පත, බැංකු ගිණුම

20. අරවින්දගේ ව්‍යාපාරයට රු. 20 000 ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට මිලදී ගැනීමට අදාළව ගිණුම්වල සටහන් කළ යුතු නිවැරදි ද්විත්ව සටහන ඇතුළත් පිළිතුර තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | භාණ්ඩ තොග ගිණුම | හර | රු. 20 000 | |
| | මුදල් ගිණුම | බැර | | රු. 20 000 |
| (2) | භාණ්ඩ තොග ගිණුම | හර | රු. 20 000 | |
| | ණය හිමි ගිණුම | බැර | | රු. 20 000 |
| (3) | ගැනුම් ගිණුම | හර | රු. 20 000 | |
| | මුදල් ගිණුම | බැර | | රු. 20 000 |
| (4) | ගැනුම් ගිණුම | හර | රු. 20 000 | |
| | ණය හිමි ගිණුම | බැර | | රු. 20 000 |

21. හර්ෂගේ ව්‍යාපාරයේ 2018-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොත්වලින් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රාග්ධනය රු. 500 000
- විකුණුම් ආදායම් රු. 75 000
- කොමිස් ආදායම් රු. 50 000
- වසරට අදාළ වියදම් රු. 50 000
- ගැනිලි රු. 10 000

2018/12/31 දිනට හර්ෂගේ හිමිකම

(1) රු. 550 000 කි. (2) රු. 565 000 කි. (3) රු. 590 000 කි. (4) රු. 625 000 කි.

22. නිමල්ගේ ව්‍යාපාරය කමල් සමාගමෙන් රු. 25 000 ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට ලබාගන්නා ලදී. අඩුකළ වට්ටම් 10% කි. මෙම ගනුදෙනුවට අදාළ නිවැරදි වටිනාකම් සහිත ද්විත්ව සටහන වන්නේ,

(1) ගැනුම් ගිණුම හර රු. 25 000
ණයහිමි කමල් ගිණුම රු. 25 000

(2) කමල් ගිණුම හර රු. 25 000
ගැනුම් ගිණුම රු. 25 000

(3) ගැනුම් ගිණුම හර රු. 22 500
ණයහිමි කමල් ගිණුම රු. 22 500

(4) ගැනුම් ගිණුම හර රු. 25 000
කමල් ගිණුම රු. 22 500
වට්ටම් ගිණුම රු. 2 500

23. පහත සඳහන් තොරතුරු ඔබට ලබා දී ඇත.

A රු. 5 000 ක් වටිනා භාණ්ඩ තොගයක් අත්පිට විකිණීම.

B රු. 100 000 ක් වටිනා යන්ත්‍රයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රුවන්ගෙන් ණයට ගැනීම.

C රු. 20 000 ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට ලබා ගැනීම.

D රු. 5 000 ක් මුදල් පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන යාම.

ඉහත සඳහන් ගනුදෙනු අයිතමයන් අතරින් පොදු ජ'නලයේ වාර්තා කරන ගනුදෙනු වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

24. අමල්ගේ ව්‍යාපාරයේ මූලික පොත්වල සටහන් කරන ගනුදෙනු දෙකක් පහත දැක්වේ.

අත්පිට විකුණුම් රු. 12 000
වැටුප් ගෙවීම රු. 14 000

ඉහත ගනුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කිරීමේදී භාවිත කළ මූලාශ්‍ර ලේඛන පිළිවෙලින්,

(1) විකුණුම් ඉන්වොයිසිය, ගැනුම් ඉන්වොයිසිය

(2) ලදුපත, ගැනුම් ඉන්වොයිසිය

(3) ලදුපත, ගෙවීම් වවුචරය

(4) ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය

25. ව්‍යාපාරයක පැවති සුළු මුදල් අග්‍රිමය රු. 5 000 කි. 2019.03.31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 800 ක් වූ අතර එදින ප්‍රතිපූර්ණය කළ මුදල රු. 5 200 කි. මාර්තු මාසයේ සිට සුළු මුදල් අග්‍රිමය කොපමණ මුදලකින් වැඩිකර තිබේද?

(1) රු. 800 කි. (2) රු. 1 000 කි. (3) රු. 2 000 කි. (4) රු. 5 000 කි.

- **පහත තොරතුරු ඇසුරෙන් 26 හා 27 ට පිළිතුරු සපයන්න.**

ව්‍යාපාරයක 2019.10.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 15 500 ක් වූ අතර එදිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය ඊට වෙනස් විය. වෙනසට හේතු පහත දැක්වේ.

A බැංකුව විසින් අයකර ගත් රු. 500 ක බැංකු ගාස්තු

B බැංකුවට සෘජුවම ලැබී තිබූ ආයෝජන ආදායම රු. 5 000

C ස්ථාර නියෝග මත බැංකුව අයකර ගත් රු. 2 500 ක රක්‍ෂණ වාරිකය

D තැන්පත් කළ නමුත් නිෂ්කාශණය නොවූ චෙක්පත් රු. 4 500

26. සංශෝධිත බැංකු ගිණුම ගැලපිය යුතු ගනුදෙනු තෝරන්න.

(1) A, B පමණි. (2) B, C පමණි. (3) A, B, C පමණි. (4) A, B, D පමණි.

27. 2019.10.31 දිනට බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය වන්නේ,

(1) රු. 13 000 කි. (2) රු. 17 500 කි. (3) රු. 20 500 කි. (4) රු. 22 000 කි.

- **පහත තොරතුරු ඇසුරින් 28 හා 29 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  කේෂලාගේ ව්‍යාපාරයේ ගිණුම්තබන්නා විසින් රු. 5 400 ක් විදුලි වියදම් ගෙවීම එම ගිණුමේ සටහන් කර ඇත්තේ 4 500 ක් ලෙසය.

28. ඉහත වරද නිසා කේෂලාගේ ව්‍යාපාරයේ,
   (1) ශේෂ පිරික්සුමේ සමාන තාවයට බලපෑමක් ඇති නොවීය.
   (2) අවිනිශ්චිත ගිණුමේ රු. 900 ක බැර ශේෂයක් ඇති වේ.
   (3) ශේෂ පරික්සුම බැර තීරුව රු. 900 ක් අඩු වීම නිසා එය අවිනිශ්චිත ගිණුමට මාරු කල යුතුය.
   (4) ශේෂ පරික්සුමේ හර පැත්තේ රු. 900 ක් අඩුවෙන් පෙන්වයි.

29. ඉහත වරද නිවැරදි කිරීමට අදාළ නිවැරදි ජ'නල් සටහන වනුයේ,

| | | | | |
|---|---|---|---|---|
| (1) | අවිනිශ්චිත ගිණුම | හර | රු. 900 | |
| | විදුලි වියදම් ගිණුම | බැර | | රු. 900 |
| (2) | විදුලි වියදම් ගිණුම | හර | රු. 5 400 | |
| | මුදල් ගිණුම | බැර | | රු. 5 400 |
| (3) | විදුලි වියදම් ගිණුම | හර | රු. 900 | |
| | අවිනිශ්චිත ගිණුම | බැර | | රු. 900 |
| (4) | විදුලි වියදම් ගිණුම | හර | රු. 1 800 | |
| | අවිනිශ්චිත ගිණුම | බැර | | රු. 1 800 |

30. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සම්බන්ධයෙන් දී ඇති පහත ප්‍රකාශ අතරින් නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.
   (1) ලැබීම් හා ගෙවීම් ගිණුමමුදල් පදනමට පිළියෙල කරන අතර ආදායම් වියදම් ගිණුම උපචිත පදනමට පිළියෙල කරයි.
   (2) ලැබීම් හා ගෙවීම් ගිණුම තුළින් මුදල් ශේෂය ගණනය කරන අතර ආදායම් වියදම් ගිණුම තුළින් ලාභය හෝ අලාභය ගණනය කරයි.
   (3) ලැබීම් ගෙවීම් ගිණුම මුදල් පොතට සමාන වන අතර ආදායම් වියදම් ගිණුම ලාභ හෝ අලාභ ප්‍රකාශයට සමාන වේ.
   (4) ආදායම් හා වියදම් අතර වෙනස සමුච්චිත අරමුදල සඳහා බලපානු ලබයි.

31. බේකරි ආහාර නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන සේවක වැටුප්,
   (1) පොදු කාර්ය පිරිවැයට අයත් වේ. (2) වක්‍ර පිරිවැයට අයත් වේ.
   (3) ප්‍රාථමික පිරිවැයට අයත් වේ. (4) ද්‍රව්‍ය පිරිවැයට අයත් වේ.

- නිෂ්පාදන ආයතනයකට අදාළව පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| නිෂ්පාදන ඒකක ගණන | 1000 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 60 000 |
| ප්‍රාථමික පිරිවැය | 340 000 |

  ඒකකයක ලාභාන්තිකය 10% කි.

32. ඉහත තොරතුරු වලට අනුව මෙම ව්‍යාපාරය ඒකකය විකුණුම් මිල වනුයේ,
   (1) 400 කි. (2) 40 කි. (3) 440 කි. (4) 100 කි.

33. කොළඹ කොටස් වෙළඳපොළෙහි කටයුතු අධීක්ෂණය හා විධිමත් කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනය වනුයේ,
   (1) ශ්‍රී ලංකා මහ බැංකුව (2) මුදල් අමාත්‍යංශය
   (3) ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව (4) කොටස් වෙළඳ පොළ තැරැව්කාර ආයතන

34. සමාගමක කොටස් වල ආයෝජනය කළ ආයෝජනයෙකු ඒවා නැවත විකිණීම තුළින්,

(1) ලාභාංශ ආදායම් ලබයි. (2) ප්‍රාග්ධන ලාභ උපයයි.

(3) ශුද්ධ ලාභ උපයයි. (4) කොටස් ප්‍රාග්ධනයට හිමිකම් කියයි.

35. කසුන්ගේ ව්‍යාපාරයේ මාසික රක්ෂණ වාරිකය රු. 4 000 ක් වන අතර 2018 වර්ෂයේ රු. 40 000 ක් මුදලින් ගෙවා ඇත. කසුන් විසින් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වල ඉහත ගනුදෙනුව දැක්විය යුත්තේ,

(1) රු. 40 000 ක වියදමක් හා රු. 8000 ක වගකීමක් ලෙසය.

(2) රු. 48 000 ක වියදමක් හා රු. 40 000 ක වගකීමක් ලෙසය.

(3) රු. 48 000 ක වියදමක් හා රු. 8000 වගකීමක් ලෙස ය.

(4) රු. 8 000 ක වියදමක් හා රු. 40 000 ක වගකීමක් ලෙස ය.

**හරේෂාගේ ව්‍යාපාරයේ 2018/12/31 දිනට පහත තොරතුරු දී ඇත.**

ශේෂ පිරික්සුම

| | | |
|---|---|---|
| ගැනුම් | 150 000 | |
| ආරම්භක තොගය | 30 000 | |
| විකුණුම් | | 300 000 |
| විදුලි වියදම | 15 000 | |
| බැංකු ණය | | 150 000 |
| ආයෝජන පොළී | | 10 000 |
| බැංකු ණය පොළී | 5 000 | |
| ණය ගැතියෝ | 40 000 | |
| මුදල් | 20 000 | |
| ප්‍රාග්ධනය | | 300 000 |
| දිගු කාලීන ආයෝජන | 400 000 | |
| ලී බඩු උපකරණ | 100 000 | |
| | 760 000 | 760 000 |

අතිරේඛ තොරතුරු

1 අවසන් තොගය රු. 30 000 කි.

2 බැංකු ණය පොළී රු. 4 000 ක් උපචිතව ඇත.

36. මෙම ව්‍යාපාරයේ 2018/12/31 න් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වනුයේ,

(1) 30 000 (2) 150 000 (3) 180 000 (4) 300 000

37. 2018/12/31 න් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණද?

(1) රු. 24 000 (2) රු. 136 000 (3) රු. 150 000 (4) රු. 160 000

38. ගිණුම් වර්ෂය අවසාන දිනට මෙම ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ජංගම වගකීම් වල වටිනාකම වනුයේ,

(1) ජංගම වගකීම් නොමැත. (2) රු. 154 000 කි.

(3) රු. 150 000 කි. (4) රු. 4000 කි.

39. 2018/12/31 දිනට මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම කොපමණද?

(1) රු. 180 000 කි. (2) රු. 300 000 කි. (3) රු. 436 000 කි. (4) රු. 590 000 කි.

40. මෙම ව්‍යාපාරයේ 2018/12/31 දිනට ජංගම නොවන වත්කම් හා ජංගම වත්කම් දැක්වෙන ප්‍රකාශය වනුයේ,

(1) රු. 500 000 ක් හා 90 000 කි. (2) රු. 436 000 ක් හා 40 000 කි.

(3) රු. 436 000 ක් හා 154 000 කි. (4) රු. 300 000 ක් හා 136 000 කි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

<u>වැදගත් :</u>

- පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්ණයටත් I කොටසින් ප්‍රශ්න දෙකකටත් II කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

01. පහත සිද්ධිය ඇසුරින් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජීවක ස්වාභාවික වනාන්තරයක් අසල ගම්මානයක ජීවත් වූ අයෙකි. ඔහුගේ පියා පාරම්පරික දේශීය වෛද්‍යවරයෙකි. කුඩා කල පටන් ජීවකට ඖෂධ පිළිබඳ අත්දැකීම් ලැබුණි. උසස් පෙළ හැදැරීමෙන් පසු ඔහු විවිධ අත්හදා බැලීම් කරමින්, ඖෂධ පැළෑටි භාවිතා කර "ජීව ඔසු" සන්නාමය යටතේ බොතල් කළ විශේෂිත ඖෂධීය පාන නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එය රෝග කිහිපයකට මහත් සහනයක් ගෙන දෙන්නක් විය. 2019.01.01 දින නිෂ්පාදන කටයුතු ආරම්භ කළ අතර මේ සඳහා ඔහු ඉතිරිකරගත් රු. 200 000 මුදල ද රු. 100 000 බැංකු ණයක් ද ලබා ගන්නා ලදී. නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම සහ ගොඩනැගිල්ල කුලියට ලබා ගන්නා ලදී. 2019.01.02 දින රු. 50 000 වැය කර අවශ්‍ය යන්ත්‍ර උපකරණ ලබා ගන්නා ලදී. 2019.01.03 දින රු. 20 000 ක් තැන්පත් කොට බැංකු ජංගම ගිණුමක් ආරම්භ කරන ලදී. නිෂ්පාදන කටයුතු සඳහා සේවකයන් 02 බඳවා ගන්නා ලදී. නිෂ්පාදන කටයුතු සැලසුම් කළ පරිදි ගුණාත්වයෙන් සකස් කරන්නේ දැයි නිතර ජීවක සොයා බලන අතර සේවකයන් එම කාර්යයන් නිසි ලෙස ඉටු කිරීමට පෙළඹ වීම ජීවක විසින් කරනු ලබයි.

2019.01.31 දිනෙන් අවසන් මාසය තුළ දී පහත ගනුදෙනු සිදු වී තිබුණි.

| | | | |
|---|---|---|---|
| 2019/01/05 | ඖෂධීය පැළෑටි මිලදී ගැනීම. | රු. | 20 000 |
| 2019/01/06 | ඇසුරුම් බෝතල් | රු. | 11 000 |
| 2019/01/07 | ලේබල් සඳහා | රු. | 1 500 |
| 2019/01/20 | නිෂ්පාදන සේවකයන්ට වැටුප් | රු. | 30 000 |
| 2019/01/22 | කම්හල් කුලී (චෙක්පතකින්) | රු. | 10 000 |
| 2019/01/23 | කම්හල් විදුලි වියදම් (චෙක්පතකින්) | රු. | 2 000 |

යන්ත්‍ර උපකරණ වාර්ෂිකව 12% ක්ෂය කරයි. ඉතිරි ද්‍රව්‍ය කිසිවක් නොමැත.

මාසය තුළ නිෂ්පාදනය කළ ඖෂධ බෝතල් ගණන රු. 1 000 කි. ඒවා සියල්ල නිෂ්පාදන පිරිවැයට 20% ලාභයක් තබාගෙන විකුණන ලදී. ඔහුගේ Face book පිටුව හරහා ප්‍රචාරණය කළ අතර ඊළඟ මාසයේ වැඩි ඇණවුම් ප්‍රමාණයක් ලැබී ඇති බැවින් වාරික ක්‍රමයට ගෙවීමට බෙදා හැරීමේ රථයක් ගැනීමට තීරණය විය.

(i) (අ) "ජීව ඔසු ව්‍යාපාරය" අරමුණු අනුව සහ අයිතිය අනුව කුමන ව්‍යාපාර වර්ගයන්ට අයත් වේද?

(ආ) සංවිධාන ක්‍රමය අනුව කුමන ව්‍යාපාර වර්ගයකට අයත් වේද?

(ii) (අ) ජීව ඔසු ව්‍යාපාරයේ ශක්තීන් 01 ක් සහ අවස්ථා 01 ක් ලියන්න.

(ආ) මෙම ව්‍යාපාර සිද්ධියේ සඳහන් සන්නිවේදනයන්ට අදාළ සන්නිවේදන මාධ්‍ය හා සන්නිවේදන ක්‍රමය දක්වන්න.

(iii) පහත දැක්වෙන කළමනාකරණ කාර්යන් වලට සිද්ධියේ දැක්වෙන නිදසුන් සපයන්න.

1 සැලසුම්කරණය -

2 සංවිධානකරණය -

3 මෙහෙයවීම -

4 පාලනය -

(iv) පහත දැක්වෙන ආකෘතිය, භාවිතා කරමින් ජීවක ඔසු බෝතල් නිපදවීමේ ව්‍යාපාරයට අදාළ එක් එක් නිෂ්පාදන සාධකය සඳහා නිදසුන් සපයන්න.

| නිෂ්පාදන සාධකය | නිෂ්පාදන සාධකය සඳහා නිදසුන් |
|---|---|
| A භූමිය | |
| B ශ්‍රමය | |
| C ප්‍රාග්ධනය | |
| D ව්‍යවසාය | |

(v) 2019/01/01 මෙම ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න.

(vi) මෙම ව්‍යාපාරයේ පවත්වාගෙන යා යුතු මූලික පොත් 02 ක් නම් කර ඊට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරන්න.

(vii) මෙම ව්‍යාපාරයේ බැංකු ගිණුම පිළියෙල කර 2019/01/31 දිනට තුලනය කර දක්වන්න.

(viii) (අ) 2019 ජනවාරි මාසයට අදාළ යන්ත්‍ර උපකරණ ක්ෂය ප්‍රමාණය කොපමණද?

(ආ) එම මාසයට අදාළ යන්ත්‍ර උපකරණ ක්ෂය ගිණුම්ගත කිරීමට අදාළ ජර්නල් සටහන ලියන්න.

(ix) (අ) ජීවක ඔසු පැන් බෝතලයක මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(ආ) එක් ඔසු පැන් බෝතලයක විකුණුම් මිල ගණනය කරන්න.

(x) මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ගණනය කරන්න.

## I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) "ව්‍යාපාරයක්" යන්න අර්ථ දක්වන්න. (ල.01)

(ආ) ව්‍යාපාර කටයුතුවල නියැලීමෙන් ව්‍යාපාර අපේක්ෂා කරන අරමුණු 02 ක් ලියන්න. (ල.01)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) අතීතයේ මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා බාටර් ක්‍රමය භාවිතා කරන ලදී.

(ආ) නිෂ්පාදන කාර්යයේදී යොදා ගන්නා කර්මාන්තශාලාව නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ.

(ඉ) භාණ්ඩ නැවත විකිණීමේ පරමාර්ථයෙන් හෝ සිය පාරිභෝජනය සඳහා වූ පරමාර්ථයෙන් මිලදී ගන්නා, ගනුදෙනුකරුය.

(ඊ) ඒක පුද්ගල ව්‍යාපාර වඩාත් සාර්ථක වන්නේ නෛතික පුද්ගලභාවයක් ඇති නිසාය.

(ල. 02)

(iii) රට පුරා ජනප්‍රිය වී ඇති "හෙල බොජුන් හල්" සංකල්පය හේතුවෙන් දේශීය ආහාර වර්තමානයේ පාරිභෝගිකයින් අතර ඉහළ ඉල්ලුමක් පවතී. මෙය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද සංකල්පයකි.

(අ) "හෙල බොජුන් හල්" සංකල්ප ඇරඹීම තුලින් රජය අපේක්ෂ කළ අරමුණු 2 ක් සඳහන් කරන්න. (ල.01)

(ආ) ඉහත සංකල්පය හේතුවෙන් බලපෑම් සිදුවන පාර්ශව 02 ක් නම් කරන්න. (ල.01)

(iv) සුසිල හේමසිංහ විනෝද චාරිකා සංවිධානය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. දිනෙන් දින දියුණු වන මෙම ව්‍යාපාරය විදේශ සංචාරකයින් අතරට ද ගෙනයාමට ඔහුට අවශ්‍ය වී ඇත.

(අ) විදේශ සංචාරකයින් සම්බන්ධ කර ගැනීම සඳහා භාවිතා කල හැකි සන්නිවේදන මාධ්‍ය සඳහා නිදසුන් 02 ක් ලබා දෙන්න. (ල.01)

(ආ) සුසිලාගේ ව්‍යාපාරයේ නිෂ්පාදන සාධකයක් දක්වා ඒ සඳහා උදාහරණයක් ලබා දෙන්න. (ල.01)

03. (i) (අ) ව්‍යාපාර සංවිධානයක් යනු කුමක්ද?

(ආ) ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේදී සැලකිල්ලට ගනුලබන සාධක 02 ක් ලියන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) රාජ්‍ය සංස්ථාවක් උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.

(ආ) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, යොදවා ඇති ප්‍රාග්ධන ප්‍රමාණය අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ද යන්න හඳුනා ගනියි.

(ඉ) සමූපකාර සමිති ලාභ අරමුණකරගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයක් ලෙස සැලකේ.

(ඊ) සාපේක්ෂ ඒකකයක විකුණුම් මිල අඩුවීම තොග වෙළඳාමේ ලක්ෂණයකි. (ල.02)

(iii) ඇගළුම් නිෂ්පාදන කර්මාන්තයේ යෙදී සිටින ඇන්ටන් සිල්වා වෙනත් රටකින් අමුද්‍රව්‍ය ගෙන නිමි ද්‍රව්‍ය තවත් රටකට විකුණයි. මෙහි දැක්වෙන වෙළඳාමේ ප්‍රභේද දෙක දක්වා ඊට අදාළ නිදසුන් දක්වන්න. (ල.02)

(iv) (අ) ව්‍යාපාරිකයෙකුට තම ව්‍යාපාර කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා ආරම්භ කළ හැකි වඩාත් සුදුසු බැංකු ගිණුම් වර්ගය කුමක්ද?

(ආ) එම ගිණුමක ඇති සුවිශේෂතාවයක් ලියන්න. (ල.02)

04. (i) (අ) චෙක්පත් පිටසන් කිරීම යනු කුමක්ද? (ල.01)

(ආ) එලෙස පිටසන් කිරීමක් අවශ්‍යවන්නේ කුමන අවස්ථාවේදීද? (ල.01)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ගොඩනැගිල්ලක නීත්‍යානුකූල හිමිකරුට ගොඩනැගිල්ල පිළිබඳ රක්ෂණ හිමිකමක් ඇත.

(ආ) දේපල හා ජීවිත රක්ෂණය කළ විට ඒවායේ අවදානම නැතිවේ.

(ඉ) සන්නිවේදන ක්‍රියාවලියේදී ප්‍රතිචාරය හා ප්‍රතිපෝෂණය එකම කාර්යයක් සිදුකරයි.

(ඊ) ප්‍රවාහන පිරිවැය සහ භාණ්ඩයක මිල අතර සෘජු සම්බන්ධතාවක් පවතී. (ල.02)

(iii) (අ) පාසල් ළමුන් ඉලක්ක කරමින් අරඹන ව්‍යාපාරයක් සඳහා සුදුසු නිෂ්පාදනයක් යෝජනා කරන්න. (ල.01)

(ආ) එම නිෂ්පාදනය සඳහා ප්‍රවර්ධන මිශ්‍රය භාවිතා කල හැකි ආකාරයක් දක්වන්න. (ල.01)

(iv) කොටස් වෙළඳපල ආයෝජනය තුළින් ආයෝජකයකුට ලබාගත හැකි ප්‍රතිලාභ 2 ක් දක්වන්න. (ල.02)

## II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) ආදායම් ගිණුම්වලට අදාළ ද්විත්ව සටහන් මූලධර්මය ලියන්න.

(ආ) වත්කමක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ල.02)

(ii) නාරදගේ ව්‍යාපාරයේ 2019 ජනවාරි මාසයට අදාළ ගනුදෙනු කිහිපයක් පහත දී ඇත.

(1) රු. 100 000 ක බැංකු ණයක් ලබා ගැනීම.

(2) රු. 5 000 ක සේවක වැටුප් ගෙවීම.

(3) රු. 4 000 ක භාණ්ඩ තොගයක් අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන යාම.

(4) රු. 6 000 ක් ණයහිමියන්ට ගෙවීම.

(5) රු. 2 000 ක ණයගැතියෙකු බොල්ණය වීම.

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (පිළිතුරු සැපයීමේදී පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න. පළමු ගනුදෙනුව උදාහරණ ලෙස සටහන් කර ඇත.)

| ගනුදෙනුව | වත්කම් = | වගකීම් + | අයිතකරුගේ හිමිකම් |
|---|---|---|---|
| 01 | මුදල් + 100 000 | බැංකු ණය + 100 000 | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

(ල.02)

(iii) අකලංකගේ ව්‍යාපාරයේ 2019 මැයි මාසයේ ණයට ගැනුම් විස්තර පහත දී ඇත.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | ඉන්වොයිසියේ ලකුණු කළ මිල | වෙළඳ වට්ටම |
|---|---|---|---|---|
| 05.08 | 126 | රංග | 35 000 | 10% |
| 05.12 | 334 | සුරංග | 40 000 | 5% |
| 05.20 | 163 | එරංග | 6 750 | - |

අවශ්‍ය වන්නේ,

(අ) මැයි මාසයේ ගැනුම් ජ'නලය පිළියෙල කිරීම.

(ආ) අදාළ ලෙජර් ගිණුම් පිළියෙල කිරීම. (ල.04)

(iv) නාමල්ගේ ව්‍යාපාරයේ 2019 නොවැම්බර් මාසයේ සුළු මුදල් පොත පහත දැක්වේ.

සුළු මුදල් පොත

| ලැබීම | ස.පි. | දිනය | විස්තරය | ව.අ. | ගෙවීම් | විශ්ලේෂණ තීරු | | | | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ගමන් | සංග්‍රහ | ලිපිද්‍රව්‍ය | ලෙජර් ගිණුම | |
| 400 | | 11/01 | ශේෂය | | | | | | | |
| 1600 | | 11/03 | මුදල් | | | | | | | |
| | | 11/05 | සංග්‍රහ වියදම් | 1 | 200 | | 200 | | | |
| | | 11/07 | ත්‍රිරෝද රථ ගාස්තු | 2 | 250 | 250 | | | | |
| | | 11/08 | ලිපි ද්‍රව්‍ය වියදම් | 3 | 120 | | | 120 | | |
| | | 11/10 | ණයහිමි- අමල්ට ගෙව්වා | 4 | 400 | | | | 400 | |
| | | 11/12 | ගමන් වියදම් | 5 | 150 | 150 | | | | |
| | | 11/15 | සංග්‍රහ වියදම් | 6 | 100 | | 100 | | | |
| | | 11/18 | පෑන් මිලදී ගැනීම | 7 | 60 | | | 60 | | |
| | | 11/21 | ගමන් ගාස්තු | 8 | 110 | 110 | | | | |
| | | 11/26 | ලිපි ද්‍රව්‍ය වියදම | 9 | 130 | | | 130 | | |
| | | | | | 1520 | 510 | 300 | 310 | 400 | |
| | | 11/30 | ප/ගෙ/ශේෂය | | 480 | | | | | |
| 2000 | | | | | 2000 | | | | | |
| 480 | | 12/01 | ඉ/ගෙ/ශේෂය | | | | | | | |

අවශ්‍ය වන්නේ,

(අ) මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම (ල.01)

(ආ) 2019/12/01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල (ල.01)

(ඉ) ඉහත සුළු මුදල් ගෙවීම්වලට අදාළ තොරතුරු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම. (ල.02)

06. (i) (අ) බැංකු අයිරාව යනු කුමක්ද?

(ආ) නිෂ්පාදන පිරිවැයේ මූලිකාංග නම් කරන්න. (ල.02)

(ii) මල් පෝච්චි නිෂ්පාදනය කරන ව්‍යාපාරයක 2019 මැයි මාසයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 30 000
- මුළු නිෂ්පාදන පිරිවැය රු. 90 000
- ඍජු ශ්‍රම පිරිවැය රු. 15 000
- ඍජු වෙනත් පිරිවැය රු. 5 000
- එක් මල් පෝච්චියක පිරිවැය රු. 60

අවශ්‍ය වන්නේ,

(අ) මැයි මාසයේ නිෂ්පාදනය කළ මල් පෝච්චි ගණන.

(ආ) මැයි මාසයේ ඍජු ද්‍රව්‍ය පිරිවැය (ල.02)

(iii) පෙරේරාගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම සමාන නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුමකට ඇතුලත් කරන ලදී.

ගිණුම් පරීක්ෂාවේදී පහත වැරදි අනාවරණය වී ඇත.

- රු. 21 000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වලින් මඟ හැරීම.
- රු. 2 500 ක ගෙවූ විදුලි වියදම විදුලි වියදම් ගිණුමේ සටහන් නොවීම.
- රු. 500 ක ලද වට්ටම දුන් වට්ටම් ගිණුමේ හරට සටහන් වීම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහනක්

(ආ) අවිනිශ්චිත ගිණුම (ල.04)

(iv) 2019 නොවැම්බර් මාසයේ විරංගගේ ව්‍යාපාරයේ බැංකු ශේෂය රු. 42 000 කි. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය ඊට සමාන නොවීය. පහත හේතු වෙනසට බලපා ඇත.

- බැංකුව අයකල බැංකු ගාස්තුව රු. 2 500 කි.
- තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක් රු. 12 000 කි.
- ණය ගැතියෙකු ඍජුවම ගිණුමට එකතු කළ මුදල රු. 6 000 කි.
- නිකුත් කල ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 9 000 කි.

අවශ්‍ය වන්නේ,

(අ) 2019.11.30 දිනට සංශෝධිත බැංකු ගිණුම

(ආ) 2019.11.30 දිනට බැංකු සැසඳුම් විස්තරය (ල.04)

07. (i) (අ) ව්‍යාපාර විසින් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන 02 ක් නම් කරන්න. (ල.01)

(ආ) දමිත්ගේ ව්‍යාපාරයේ 2018 වර්ෂය තුලදී රක්ෂණ ගාස්තු ලෙස රුපියල් 10 000 ක් ගෙවා ඇති අතර තවත් රු. 3 000 ක් ගෙවීමට ඇත. මෙහි ගෙවිය යුතු රක්ෂණ ගාස්තු ගිණුම්ගත කිරීමට අදාළ ජ'නල් සටහන් දක්වන්න. (ල.01)

(ii) මිනිමිතු ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් 100 දෙනෙකු සිටින අතර එක් අයෙකුගේ මාසික සාමාජික මුදල රු. 50 කි. 2018 වර්ෂය තුල සාමාජිකයන් 90 දෙනෙකු සාමාජික මුදල් ගෙවා ඇත.

(අ) වර්ෂය තුල මුදලින් ලැබූ සාමාජික මුදල කොපමණද?

(ආ) 2018 වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනු ලබන වටිනාකම කොපමණද? (ල.02)

(iii) රසෝදාගේ ව්‍යාපාරයේ 2018/12/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

ශේෂ පිරික්සුම

| | | බැර |
|---|---|---|
| විකුණුම් | | 450 000 |
| ණය ගැතියෝ | 40 000 | |
| ණය හිමියෝ | | 30 000 |
| ගැනුම් | 80 000 | |
| ගෙන ඒමේ කුලී | 5 000 | |
| තොගය (2018/01/01 දිනට) | 25 000 | |
| බොල් ණය | 3 000 | |
| විදුලිය | 4 000 | |
| සේවක වැටුප් | 15 000 | |
| 10% බැංකු ණය | | 100 000 |
| බැංකු ණය පොළී | 7 000 | |
| දුන් වට්ටම් | 3 000 | |
| ඉඩම් | 300 000 | |
| මෝටර් රථ | 200 000 | |
| මෝටර් රථ ක්ෂය වෙන් කිරීම 2018/01/01 දිනට | | 80 000 |
| මුදල් ශේෂය | 50 000 | |
| ප්‍රාග්ධනය | | 72 000 |
| | 732 000 | 732 000 |

අතිරේඛ තොරතුරු

1 2018/12/31 දිනට තොගය රු. 20 000 කි.

2 විදුලි වියදම් රු. 1 000 ක් හා සේවක වැටුප් රු. 5000 උපචිතව ඇත.

3 මෝටර් රථ 10% බැගින් ක්ෂය කල යුතුය.

අවශ්‍ය වන්නේ,

(අ) 2018/12/31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ල.04)

(ආ) 2018/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ල.04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (3) | 2 - (1) | 3 - (3) | 4 - (4) | 5 - (2) | 6 - (3) | 7 - (2) | 8 - (3) | 9 - (4) | 10 - (4) |
| 11 - (3) | 12 - (1) | 13 - (3) | 14 - (1) | 15 - (1) | 16 - (3) | 17 - (2) | 18 - (4) | 19 - (4) | 20 - (4) |
| 21 - (2) | 22 - (3) | 23 - (2) | 24 - (3) | 25 - (2) | 26 - (3) | 27 - (1) | 28 - (4) | 29 - (3) | 30 - (2) |
| 31 - (3) | 32 - (3) | 33 - (2) | 34 - (2) | 35 - (3) | 36 - (2) | 37 - (2) | 38 - (4) | 39 - (3) | 40 - (1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය - I කොටස

01. (i) (අ) අරමුණු අනුව - ලාභ අරමුණු කරගත් ව්‍යාපාර

අයිතිය අනුව - පෞද්ගලික අංශයේ ව්‍යාපාර (ල. ½ x2 = 01)

(ආ) තනි / ඒක / කේවල ව්‍යාපාර (ල. 01)

(ii) (අ) <u>ශක්තීන්</u>

ජීවක පරම්පාරික දේශීය වෛද්‍යවරයෙකුගේ පුතෙක් වීම.

දේශීය ඖෂධ පිළිබඳ අත්දැකීම් ඔහු සතු වීම.

ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම.

සන්නාමයක් ලබා ගැනීම (ල. ½ )

<u>අවස්ථා</u>

වනාන්තරයන් අසල ගම්මානයක ජීවත්වීම. (ල. ½ )

(ආ) සන්නිවේදන මාධ්‍ය - විද්‍යුත්

සන්නිවේදන ක්‍රමය - Face book (ල. ½ x2 = 01)

(iii) 1 සැලසුම්කරණය - වාරික ක්‍රමයට ගෙවීමට බෙදා හැරීමේ රථයක් ගැනීමට තීරණය කිරීම.

2 සංවිධානකරණය - සේවකයන් 02 බඳවා ගැනීම

3 මෙහෙයවීම - සේවකයන් කාර්යන්හි නිසි ලෙස ඉටුකිරීමට පෙළඹවීම

4 පාලනය - සැලසුම් කළ පරිදි ගුණාත්වයෙන් නිෂ්පාදන සකස් කරන්නේදැයි සොයා බැලීම.

(ල. ½ x4 = 04)

(iv)

| | නිෂ්පාදන සාධකය | නිෂ්පාදන සාධකය සඳහා නිදසුන් |
|---|---|---|
| A | භූමිය | ස්වභාවික වනාන්තර / ඉඩම |
| B | ශ්‍රමය | සේවකයින් 02 කායික හා මානසික |
| C | ප්‍රාග්ධනය | මුදල්, ගොඩනැගිල්ල, යන්ත්‍ර උපකරණ |
| D | ව්‍යවසාය | ජීවක ඔසු නමින් ඖෂධීය පානයක් නිපදවීම. |

(ල. ½ x4 = 02)

(v)

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| මුදල් | | ප්‍රාග්ධනය | | බැංකු ණය |
| + 300 000 | | + 200 000 | | + 100 000 |

(ල. 02)

හෝ

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| මුදල් | | ප්‍රාග්ධනය | | බැංකු ණය |
| + 200 000 | | + 200 000 | | + 100 000 |
| මුදල් | | | | |
| + 100 000 | | | | |

(ල. 01)

(vi) මුදල් පොත - වවුචරය / ලදුපත

බැංකු ගිණුම - පිළිපත / මුදල් තැන්පතු පත්‍රිකාව / චෙක් තැන්පතු පත්‍රිකාව /ගෙවීම් වවුචර අගරු පොතේ දැනුම් දීමේ ලියවිල්ල

පොදු ජර්නලය - ජර්නල් වවුචරය

මූලික පොත් 02 නම් කිරීමට (ල. 01)

මූලාශ්‍ර ලේඛන 01 බැගින් 02 ක් නම් කිරීමට (ල. 01)

(vii)

බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| 01/02 | මුදල් (½) | | 20 000 | 1/22 | කම්හල් කුලී | | 10 000 | (½) |
| | | | | 1/23 | විදුලි වියදම | | 2 000 | (½) |
| | | | | 1/31 | ශේෂය ප/ගෙ | | 8 000 | |
| | | | 20 000 | | | | 20 000 | |
| 2/1 | ශේෂය ඉ/ගෙ | | 8 000 | (½) | | | | (ල. 02) |

(viii) (අ) $50\,000 \times \frac{12}{100} \times \frac{1}{12}$

රු. 500 (ල. 01)

(ආ) යන්ත්‍ර ක්ෂය ගිණුම හර 500

යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම බැර 500

(වටිනාකම් සහිත ලියා තිබීමට ල. 01)

(ix) (අ)

| | | |
|---|---|---|
| ඖෂධ පැළෑටි | 20 000 | (ල. ½) |
| නිෂ්පාදන සේවක වැටුප් | 30 000 | |
| ඇසුරුම් බෝතල් | 11 000 | |
| ලේබල් සඳහා | 1 500 | |
| කම්හල් කුලී | 10 000 | |
| විදුලි වියදම් | 2 000 | |
| යන්ත්‍ර උපකරණ ක්ෂය | 500 | (ල. ½) |
| මුළු නිෂ්පාදන පිරිවැය | 75 000 | |

මුළු නිෂ්පාදන පිරිවැය 75 000 පමණක් ඇත්නම් ලකුණු 01 පමණයි.

(ආ) රු. $\frac{75\,000}{1000}$

ඒකක පිරිවැය = රු. 75

$75 \times \frac{20}{100}$

ලාභය = රු. 15

විකුණුම් මිල = රු. 75 + 15

= රු. 90

(x) විකුණුම් ආදායම 90 x 1000 — 90 000

මුළු වියදම රු. 75 000 — 75 000

රු. 15 000 (ල.02)

I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි. (ල.01)

(ආ) ලාභය
පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම
රැකියා උත්පාදනය
භාණ්ඩ හා සේවාවල ගුණාත්වය ඉහළ නැංවීම (ල.01)

(ii) (අ) ✓ (ආ) x (ඉ) ✓ (ඊ) x (ල. 02)

(iii) (අ) 1. රටතුල හාල් ආශ්‍රිත හා වෙනත් දේශීය ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන සඳහා බලපෑම ලබාදීම.
2. ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් කරවීම.
3. ප්‍රාදේශීය (ග්‍රාමීය) ආර්ථික ශක්තිමත් කිරීම
4. රැකියා උත්පානය (ල.01)

(ආ) 1. තිරිඟුපිටි ආනයනකරුවන්
2. තිරිඟු පිටි ආශ්‍රිත ආහාර නිෂ්පාදකයින් (බේකරිකරුවන්)
3. ක්ෂණික ආහාර වෙළඳුන්
4. හාල් හා වෙනත් ධාන්‍ය සැපයුම්කරුවන්
5. මූල්‍ය ආයතන
6. ප්‍රජාව (ල.01)

(iv) (අ) 1. වෙබ් අඩවි නිර්මාණය
2. විද්‍යුත් තැපැල
3. Video chatting (IMO, whats app, viber වැනි)
4. දුරකතනය
5. සමාජ ජාලා (face book) (ල.01)

(ආ) ශ්‍රමය - රියදුරු, සංචාරක මගපෙන්වන්නන්, කෝකිවරු
ප්‍රාග්ධනය - මෝටර් රථ, හෝටල්, මුදල් (ල.01)

03. (i) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් හෝ ඒකරාශි වීම ව්‍යාපාර සංවිධානයක් ලෙස හැඳින් වේ.

(ආ) 1. අරමුණ 2. පරිමාණය 3. කළමනාකරණය සිදුවන ආකාරය (ල.02)

(ii) (අ) ✓ (ආ) x (ඉ) x (ඊ) ✓

(iii) ආනයන වෙළඳාම - රෙදි, නූල්, බොත්තම්, යන්ත්‍ර
අපනයන වෙළඳාම - නිමි ඇඳුම්
(ප්‍රභේද 2 නම් කිරීමට ල. 01, උදාහරණ 1 බැගින් 2 කට ල. 01)

(iv) (අ) ජංගම ගිණුම
(ආ) බැංකු අයිරා පහසුකම් ලැබීම.
චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි වීම
සෘජු ප්‍රේරණ රැස්කිරීම
ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම. (ල.02)

04. (i) (අ) චෙක්පතේ මුහුණත සඳහන් අදායකයාගේ නම ඒ ආකාරයටම ඔහුගේ ම අත්අකුරින් චෙක්පත පිටුපස ලිවීම. (ල.01)

(ආ) චෙක්පත වෙනත් අයකුට පැවරීමේදී, බැංකු ගිණුමක තැන්පත් කිරීමේදී (ල.02)

(ii) (අ) ✓ (ආ) x (ඉ) x (ඊ) ✓ (ල.02)

(iii) (අ) ඕනෑම සුදුසු පිළිතුරකට (ල.01)

(ආ) දැන්වීම් බෙදාදීම.

නොමිලේ සාම්පල් බෙදාදීම.
ක්‍රීඩා තරඟ සඳහා අනුග්‍රහය දැක්වීම. (ල.01)

(iv) ආයෝජකයෙකුට - ලාභාංශ
ප්‍රාග්ධන ලාභය
ඇප සුරැකුම් ලෙස භාවිතය
අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වීමට (ල.02)

## II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) ආදායම වැඩිවීම - බැර
ආදායම අඩුවීම - හර (ල.01)

(ආ) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම.
ඒ තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.
ව්‍යාපාරයට පාලනය කළ හැකි වීම. (ඕනෑම කරුණු 02 ට ල.01 කි.)

(ii)

| ගනුදෙනුව | වත්කම් = | වගකීම් + | අයිතිකරුගේ හිමිකම් | |
|---|---|---|---|---|
| 01 | මුදල් +100 000 | බැංකු ණය +100 000 | | |
| 02 | මුදල් - 5 000 | | සේවක වැටුප් - 5000 | (ල.½) |
| 03 | මුදල් - 4 000 | | ගැනිලි - 4 000 | (ල.½) |
| 04 | මුදල් - 6 000 | ණය හිමි - 6 000 | | (ල.½) |
| 05 | මුදල් - 2 000 | | බොල් ණය - 2 000 | (ල.½) |

(ල. ½x4=02)

ගැනුම් ජ'නලය

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | වටිනාකම | ලෙ.පි. |
|---|---|---|---|---|
| 05/08 | 126 | රංග (ල.½) | 31 500 | |
| 05/12 | 334 | සුරංග (ල.½) | 38 000 | |
| 05/20 | 163 | එරංග (ල.½) | 6 750 | |
| 05/31 | | එකතුව ගැනුම් ගිණුමට හර කළා | 76 250 | (ල.½) |

(ල. 02)

ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 5/31 | ණයහිමි ගිණුම | | 76 250 | | | | |

(½)

රංගගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5/8 | ගැනුම් ගිණුම | | 31 500 | (½) |

සුරංගගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 5/12 | ගැනුම් ගිණුම | | 38 000 | (½) |

එරංගගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| 5/31 | ණයහිමි ගිණුම | | 76 250 | 5/20 | ගැනුම් ගිණුම | | 6 750 | (½) |

(නිවැරදි ආකෘති නොමැති නම් ල.½ අඩු කරන්න.)

(iv) (අ) රු. 2 000 (ල. 01)

(ආ) රු. 1 520 (ල. 01)

ගමන් වියදම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| 11/30 | සුළු මුදල් පොත | | 510 | | | | | (½) |

සංග්‍රහ වියදම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| 11/30 | සුළු මුදල් පොත | | 300 | | | | | (½) |

ලිපි ද්‍රව්‍ය ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| 11/30 | සුළු මුදල් පොත | | 310 | | | | | (½) |

ණය හිමි අමල්ගේ ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| 11/30 | සුළු මුදල් පොත | | 400 | | | | | (½) |

(ල.½ x 4 = 02)

06. (i) (අ) ජංගම ගිණුමේ ඇති ශේෂය ඉක්මවා නිකුත්කර ඇති චෙක්පත්වල වටිනාකම.

හෝ

ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට බැංකුව එම චෙක්පත්වලට ගෙවීම් කිරීම නිසා ගිණුම් හිමියා බැංකුවට ණයගැති වන අගයයි. (ල.01)

(ආ) ◆ ප්‍රාථමික පිරිවැය

◆ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (ල.01)

(ii) (අ) මල් පෝච්චි ගණන - 1500 කි. (ල.01)

(ආ)

| | | | |
|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | 40 000 | සෘජු ද්‍රව්‍ය පිරිවැය | 40 000 |
| සෘජු ශ්‍රම පිරිවැය | 15 000 | | |
| සෘජු වෙනත් පිරිවැය | 5 000 | | |
| ප්‍රාථමික පිරිවැය | 60 000 | | |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 30 000 | | |
| මුළු නිෂ්පාදන පිරිවැය | 90 000 | | |

(ල.02)

(iii)

පොදු ජ'නලය

| දිනය | ජ'නල් ව/අ | විස්තරය | ලෙ. පි. | හර | බැර | |
|---|---|---|---|---|---|---|
| | | ගැනුම් ගිණුම හර | | 21 000 | | |
| | | ණයහිමි ගිණුම | | | 21 000 | (ල.01) |
| | | (ගැනුම් ඉන්වොයිසියේ පොත්වලින් මඟ හැරීම වරද නිවැරදි කිරීම.) | | | | |
| | | විදුලි වියදම් ගිණුම හර | | 2 500 | | |
| | | අවිනිශ්චිත ගිණුම | | | 2 500 | (ල.01) |
| | | (විදුලි වියදම් ගෙවීි විදුලි වියදම් ගිණුමේ සටහන් නොවීමේ වරද නිවැරදි කිරීම.) | | | | |
| | | අවිනිශ්චිත ගිණුම හර | | 1 000 | | |
| | | දුන් වට්ටම් ගිණුම | | | 500 | (ල.01) |
| | | ලද වට්ටම් ගිණුම | | | 500 | |
| | | (ලද වට්ටම් දුන් වට්ටම් ගිණුමේ සටහන් වීමේ වරද නිවැරදි කිරීම.) | | | | |

අවිනිශ්චිත ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂ පිරික්සුම | 1500 | විදුලි ගිණුම | 2500 |
| දුන් වට්ටම් | 500 | | |
| ලද වට්ටම් | 500 | | |
| | 2500 | | 2500 |

(01)

(ල.04)

(iv) (අ)

සංශෝධිත බැංකු ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 42000 | බැංකු ගාස්තු | 2500 | (½) |
| ණයගැති (½) | 6000 | ප/ගෙ/ශේෂය | 45500 | (½) |
| | 48000 | | 48000 | |

(ල. 1½)

බැංකු සැසඳුම් ප්‍රකාශය

(ආ)

| | | | | |
|---|---|---|---|---|
| සංශෝධිත බැංකු ශේෂය | (½) | | 45500 | |
| (එකතු කලා) නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත | (½) | 9000 | 9000 | |
| | | | 54500 | |
| (අඩුකලා) තැන්පත් කළ නමුත් නිෂ්කාෂනය නොවූ චෙක් | (½) | 6000 | (12000) | |
| බැංකු ප්‍රකාශයට අනුව ශේෂය (½) | | | 42500 | (½) |

(ල. 2½)

07. (i) (අ) ලාභා හෝ අලාභ ප්‍රකාශනය / ආදායම් ප්‍රකාශනය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ල.01)

(ආ) රක්ෂණ ගාස්තු ගිණු හර 3 000
ගෙවිය යුතු රක්ෂණ ගාස්තු ගිණුම 3000 (ල.01)

(ii) (අ) රු. 54 000

(ආ) රු. 60 000 (ල.02)

(iii) (අ)

රසෝදාගේ ව්‍යාපාරයේ (½)
2018/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය

| | | | | |
|---|---|---|---|---|
| විකුණුම් | | | 450 000 | |
| (-) විකුණුම් පිරිවැය | | | | |
| තොගය | | 25 000 | | |
| (+) ගැණුම් | | 80 000 | | |
| ගෙන ඒමේ කුලී | | 50 000 | | |
| | | 110 000 | | |
| තොගය | | (200 000) | (9 000) | (1) |
| දළ ලාභය | | | 360 000 | (½) |
| බෙදා හැරීම් වියදම් | | | | |
| මෝටර් රථ ක්ෂය | 20 000 | | | |
| බොල් ණය | 3 000 | | | |
| දුන් වට්ටම් | 3 000 | 26 000 (½) | | |

| | | | | |
|---|---|---|---|---|
| පරිපාලන වියදම් | | | | |
| විදුලි වියදම් | 5 000 | | | |
| සේවක වැටුප් | 20 000 | 25 000 (½) | | |
| මූල්‍ය හා වෙනත් වියදම් | | | | |
| ණය පොලිය | 10 000 | 10 000 | (61 000) | (½) |
| ශුද්ධ අලාභය ප්‍රාග්ධන ගිණුමට බැර කළා | | | 299 000 | (½) |

(ල.04)

(ආ)

මූල්‍ය තත්ව ප්‍රකාශය (½)

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශුද්ධ අගය | |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | | |
| ඉඩම් | 300 000 | | 300 000 | |
| මෝටර් රථ | 200 000 | 100 000 | 200 000 | |
| | 500 000 | 100 000 | 400 000 | (½) |
| ජංගම වත්කම් | | | | |
| තොගය | | 20 000 | | |
| ණයගැතියෝ | | 40 000 | | |
| මුදල් | | 50 000 | 110 000 | (½) |
| | | | 510 000 | |
| හිමිකම් හා වගකීම් | | | | |
| ප්‍රාග්ධනය | | 72 000 | | |
| (+) ශුද්ධ ලාභය | | (½) 299 000 | 371 000 | (½) |
| ජංගම නොවන වගකීම් | | | | |
| බැංකු ණය | | 100 000 | 100 000 | |
| ජංගම වගකීම් | | | | |
| උපචිත ණය පොලී | | 3 000 | (½) | |
| උපචිත විදුලිය | | (½) 1 000 | | |
| ණය හිමියෝ | | 5 000 | | |
| | | 30 000 | 39 000 | (½) |
| | | | 510 000 | |

(ල.04)